

# සියලු අභියෝග පරදා හියුම් මැතිවරණය ජයගත් අපේ ශ්‍රී ලාංකිකයා

# දයාසෝම බමුණුසිංහ

***ඕස්ට්‍රේලියාවේ නගර සභා මැතිවරණ ඉතිහාසය වෙනස් කරමින් අපේ නම රැන්දූ ශ්‍රී ලාංකිකයකු ලෙසත් නගර සභාවකට තේරුණ එකම ශ්‍රී ලාංකිකයා වීමේ ගෞරවයත් යන දෙකම දිනාගත් දයාසෝම බමුණුසිංහ නාගරික මන්ත්‍රීවරයාට අපේ උණුසුම් සුබපැතුම් පිළිගන්වමින් සන්නස ඔහු සමග පිළිසඳරක යෙදුණා.***

**අයුබෝවන් මන්ත්‍රීතුමා**

සමාවෙන්න තාම දිව්රුම් දුන්නෙ නෑ. පරණ විදියට දයාසෝම කිව්වම ඇති (සිනාසෙයි)

**මේක ඉතාමත්ම සතුටුදායක අවස්ථාවක්..?**

ඔව්.. ඇත්තටම හරිම සතුටුයි.. මට සතුටුවෙන්න කාරණා කීපයක්ම තියෙනවා.. එකක් තමයි ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් හියුම් නගරසභාව තුළ මට හඬක් නගන්න පුලුවන් ශක්තියක් අපේ අය ලබා දීම. ඒ එක්කම අපේ හැම ශ්‍රී ලාංකිකයකුම මේ මොහොතේ මට දැක්වූ සහයෝගය. ඒ වගේම ප්‍රථම වතාවට තේරුණ නාගරික මන්ත්‍රීවරයා වීම. ඒ වගේම මට අවුරුදු ගණනාවක් සමාජය සමග හැකි පමණ වැඩ කරමින් කැප කිරීම් කරමින් තමයි මේ ගමන එන්න සිදුවුණේ. එක පාරටම ආව ගමනක් නෙවෙයි.

**ඔව් අපි දන්නවා ඔබ සමාජසේවා කටයුතු වල නැයැලෙමින් බොහෝ කාලයක් මේසඳහා ඇප කැප වූ බව. මේ ජයග්‍රහණය ගැන විස්තරයක් කරන්න පුලුවන්ද?**

මම නියෝජනය කරන්නේ හියුම් කවුන්සිලයේ වයිට් කිං වෝඩ් කියන ප්‍රදේශය. මම නියෝජනය කරන ප්‍රදේශයට අයත්වෙනවා ක්රැගිබර්න් රොක්ස්බර්ග් පාක් මිකල්හැම් යුරෝක් කැම්බවේල් හා ෆෝක්නර් ප්‍රදේශයේ කොටසක්. ඒ වගේම උතුරු ග්‍රීන්වේල් ප්‍රදේශයත්.

**මෙවර මන්ත්‍රීවරු කී දෙනෙක් තේරුණාද?**

මන්ත්‍රීවරු හතර දෙනෙක් තේරුණා. එයින් එක් අයෙක් වීමේ භාග්‍යය මට හිමිවුණා.

**මේක විශාල ජයග්‍රහණයක් නේද?**

ඔව්. හුඟදෙනෙකුට මේක විශ්වාස කරන්නත් බැරි තරම්. අනිත් ජාතීන් එක්ක බලනකොට ශ්‍රී



ශ්‍රීනාත් මැද්දුමගේ

ලාංකිකයන් මේ ප්‍රදේශයේ ජීවත් වන්නේ අඩු ප්‍රතිශතයක්. නමුත් මෙහි වැදගත් කම ලෙස මම දකින්නේ මේ හැම කෙනෙකේම මට ඡන්ද පාවිච්චි කර තිබීම. විජාතික හිතවතුනුත් මේ මොහොතේ මට උදව් කර තිබෙන බව පේනවා.

**මේ ජයග්‍රහණයට ආ මග කොහොමද?**

මා මුලින් කිව්වා සේම නැවත වාරයක් මේ ප්‍රදේශ වල ජීවත්වන සියලුම ශ්‍රී ලාංකිකයන්ට මගේ හෘදයාගම ස්තුතිය පුද කරනවා. ඒ වගේම මේ ඡන්ද ව්‍යාපාරය දියත් කිරීමට මා අවට මගේ හිතමිතුරන් 25 ක් තිහක් පමණ හිටියා. ඒ සියලු දෙනාම මට ලෙන්ගතු මිතුරු මිතුරියන්. මේ වෙලාවේ මම නම් වශයෙන් කියන්න යන්නෙ නැහැ.

ඇත්ත වශයෙන්ම අපේ ලොකු සැළැස්මක් තිබුණා. අත් පත්‍රිකා 25000 ක් පමණ ප්‍රමාණයක් බෙදුවා. ඒවා තුන් සැරයක් බෙදුවා. මේ හැම වෙලාවෙදිම මම ඉහත සඳහන් කළ මිතුරන් මට සහය දුන්නා. හුඟක් අය වචන වලින් මා දිරිමත් කළා. ඒ වගේම මුදල් ආධාර පවා මට ලබා දුන්නා. ඒ සැමටම නැවත වාරයක් මම ස්තුතිවන්ත වෙනවා.

**දැන් ඔබ නාගරික මන්ත්‍රීවරයෙක්. ඔබේ මීළඟ ඉලක්ක මොනවාද?**

මගේ ඉලක්ක මම මගේ පත්‍රිකාවල පැහැදිලිව සඳහන් කළා. මම එයින් විශේෂයෙන්ම සූදානම් ක්‍රියාත්මක කිරීමට සූදානම්ව සිටින කාරණා කීපයක් කියන්නම්.

එකක් තමයි ක්රැගිබර්න් දුම්රිය ස්ථානයේ රථ ගාල පුළුල් කිරීම. වසර ගණනාවක් තිස්සේ මේ ගැන කතා කළත් තවම මෙය ඉටුවී නැහැ. මේ සඳහා මම සැළසුම් කරනවා හියුම් කවුන්සිලයත් වික්ටෝරියානු රජයත් සමග එකතු වී මෙය ක්‍රියාත්මක කරන්න. දෙවෙනි කාරණය තමයි දැනට 25%කින් පමණ වැඩි වෙලා තියෙන සීපීඅයි වරිපනම් බදු වසරක් පුරා වැඩිවන ප්‍රමාණය අඩු කර ගැනීම. මෙය හැමදෙනාටම දැඩිව දැනෙන ගැටළුවක්.

තුන්වන කාරනාව තමයි දැනට මෙම ප්‍රදේශයේ අපරාධ වැඩි වී තිබෙන බව අපට පෙනෙනවා. 12.65% කින් වැඩිවීමක් තිබෙනවා. වික්ටෝරියානු පොලිසියත් ෆෙඩරල් පොලිසියත් සමග එකතු වී මේ ගැන වහාම දැනෙන යමක් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මීට අමතරව බොහෝ දේවල් තිබෙනවා. ඒවා සෑම වෙලාවේදීම සිහි තබාගෙන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ඔබේ ඉදිරි සැළැස්ම ගැන සතුටුයි. අපි ඔබට සුබ පතනවා. අවසාන වශයෙන් අපේ ශ්‍රී ලාංකිකයන්ට දෙන පණිවුඩය මොකක්ද?**

මම මුලින් කිව්වා වගේ මම ගිය සැරේ මැතිවරණයෙදිත් ඉදිරිපත් වුණා. එහිදී මට ජයග්‍රහණය කරන්න නොහැකි වුණා. එවර සිටි එකම ශ්‍රී ලාංකිකයා මම පමණයි. මට ඒ වෙලාවෙ හිතුණා අපේ ශ්‍රී ලාංකිකයන් මේ සඳහා තවත් දායක වුණොත් හොඳයි කියලා. මම හැමෝම දැනුවත්කළා. මට සතුටුවෙන්න පුලුවන් මේ වසරේ නගරසභා මැතිවරණය සඳහා ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. එය සතුටක්.

මම නැවත වාරයක් කියන්නෙ අපට හැකි පමණ මේ යාන්ත්‍රණයට අපි එකතුවෙන්න ඕනේ. ඒ නිසා පුලු පුලුවන් විදියට හැම දෙනාම මේවාට සම්බන්ධ විය යුතුයි යන්නයි මගේ අපේක්ෂාව සහ හැඟීම. ඒ වගේම නැවත වාරයක් සියලුම දෙනාටම ස්තුතිවන්ත වන අතර සියලුම මාධ්‍යයන්ටත් මගේ ප්‍රණාමය පුද කරනවා.

